සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය ............................ ක්‍රිස්තියානි ධර්මය I කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

01. නායක පූජකවරයෙකු වූ 'ස්කේවා' නම් පූජකකවරයාගේ පුතුන් හා සංචාරක යකැදුරන් සම්බන්ධ සිදුවීමකට ශු.පාවුලු තුමාට මුහුණ දීමට සිදුවූයේ,

i. එපීසයේ දී ii. ඇතන්ස්හිදී iii. පිලිප්පියේදී
iv. කොරින්තියේ දී v. ගලාතියේදී

02. ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය දැන්ම සිදු නොවන බව තේමා කොට ගනිමින් ශු. පාවුලුතුමා ලියූ ලිපිය වන්නේ,

i. කොලොස්සි ලිපිය ii. I කොරින්ති ලිපිය iii. I තෙසලෝනික ලිපිය
iv. II තෙසලෝනික ලිපිය v. II කොරින්ති ලිපිය

03. කිරිඳි, නිධානය, මුතු ඇටය, දැල පිළිබඳ උපමා සඳහන් වී ඇත්තේ,

i. ශු.ලූක් සුබාරංචියේ පමණි. ii. ශු. මතෙව් සුබාරංචියේ පමණි. iii. සුබාරංචි හතරේම ඇත.
iv. සමදර්ශක සුබාරංචි වල පමණි. v. ශු. ලූක් හා මතෙව් සුබාරංචි වල පමණි.

04. සෙලට්වරුන්ගේ නිර්මාතෘ ලෙස සලකනු ලබන පුද්ගලයා වන්නේ,

i. ජුදස් මකබියස් ii. ජොනතන් iii. ගලීලයේ ජුදස්
iv. නිකදේමුස් v. ආරිමාතියේ ජෝසෙප්

05. සිරියානු - ඒප්‍රායිම් යුද්ධය සිදු වූයේ මෙම දිවැසිවරයාගේ කාලයේදී ය. එම දිවැසිවරයා වන්නේ,

i. ජෙරමියා ii. හොසියා
iii. එසකියෙල් iv. යෙසායා
v. ආමොස්

06. ක්‍රි.පූ. 7 වන සියවසේ පළමු කාර්තු තුනේදී බලවත් අධිරාජ්‍යය වූයේ,

i. අසිරියාව ii. සිරියාව iii. බබිලෝනිය
iv. මිසරය v. ග්‍රීසිය

07. ගලීලය හා පෙරයාවෙහි යුව රජු වූ මහ හෙරෝද් රජුගේ පුත්‍රයා වන්නේ,

i. ආණ්ඩුකාර අර්කෙලාවුස් ii. ආණ්ඩුකාර දෙවන හෙරොද් පිලිප්

iii. ආණ්ඩුකාර පොන්තියස් පිලාත් iv. ආණ්ඩුකාර පලවන හෙරෝද්

v. ආණ්ඩුකාර හෙරෝද් ඇන්ටිපස්

08. ජාකොබ් තුමා තම අනාගතය පිළිබඳ දේව සැලැස්ම තේරුම් ගත් 'බෙතෙල්' යන ස්ථාන නාමයෙහි අර්ථය වූයේ,

i. 'දෙවියන් වහන්සේ ඔසවන සේක' යන්නයි. ii. 'දෙවියන් වහන්සේ අප සමඟ' යන්නයි.

iii. 'දෙවියන් වහන්සේගේ ගෘහය' යන්නයි. iv. 'දේව මාළිගාව' යන්නයි.

v. 'දේව වැඩ සිටීම' යන්නයි.

09. 2, තිමති 3:16 අනුව දේවානුභාවයෙන් යුත් ශුද්ධ ලියවිල්ලේ අරමුණු පමණක් අයත් පිළිතුර වන්නේ,

i. ඉගෙන ගැනීමට, සමාව දීමට, දයාව දැක්වීමට

ii. ලිවීමට, ආදර්ශ සැපයීමට, දමිටු දිවියකට

iii. ධර්මිෂ්ඨ වීමට, දේව කරුණාව ලැබීමට, කීකරු වීමට

iv. ඉගැන්වීමට, දුර්මත දුරුකිරීමට, හික්මවීමට

v. උපදෙස් දීමට, පිළිවෙත් කිරීමට, නමස්කාරයට

10. අක්කෝ මිටියාවත විහිදී ඇත්තේ,

i. ජොප්පාවේ සිට කයිසාරිය දක්වා ii. කාර්මෙල් කඳු පාමුල සිට උතුරට

iii. බෙතෙල් සිට දාන් දක්වා iv. හෙබ්‍රොන් සිට ජෙරුසලම දක්වා

v. ගලීලයේ සිට එස්ඩ්‍රාලෝන් තැනිතලාව දක්වා

11. සිනගෝග ඇතිවීමට මූලික හේතුව වූයේ,

i. ජනතාව වත් පිළිවෙත් කිරීමට බැඳී සිටීම නිසා

ii. දේව මාළිගාව දුරින් පිහිටා තිබූ නිසා

iii. සබත් නීතිය රැකිය යුතු නිසා

iv. මෝසෙස්ගේ නීතිය අනුව කළ යුතු දෙයක් නිසා

v. දේව මාලිගාව විනාශ වී තිබූ නිසා

12. ක්‍රි.පූ. 701 දී ජෙරුසලම අසිරියානු සෙනාකෙරීබ් රජුගේ ආක්‍රමණයට ලක්වූ පසු ඇති වූ බලාපොරොත්තු රහිත අසරණ තත්වය හමුවේ නව බලාපොරොත්තු ඇති කරවන දිවැසිවරයා වන්නේ,

i. සෙකරියා ii. යෙසායා iii. මීකා

iv. නාතාන් v. ජෙරමියා

13. මුල් කිතුනු සභාව තුළ ප්‍රථම වරට 'ක්‍රිස්තියානි' යන නාමය ලැබූ ස්ථානය වන්නේ,

i. රෝමය ii. ලුකෝනියේ ලුස්ත්‍රාව iii. සයිප්‍රසය

iv. සිරියාවේ අන්තියෝකිය v. පිසිදියේ අන්තියෝකිය

14. අමලෙක්වරුන් සමඟ සටනේදී මෝසෙස්තුමා යාච්ඤා කරන විට අත් ඉහළට ඔසවාගෙන සිටීමට උපකාර වූ පුද්ගලයන් වන්නේ,

i. ආරෝන් සහ හූර් | ii. නාදාබ් සහ අබිහූම් | iii. ජෝෂුවා සහ ආරොන්
iv. නාදබ් සහ හූර් | v. හූර් සහ ජෝෂුවා

15. පැරණි ගිවිසුමෙහි පැවති දිවැසිවරයෙහි විශේෂත්වය වන්නේ,

i. පැරණි ගිවිසුමෙහි දිවැසිවරියන් දක්නට නොලැබීමයි.
ii. දිවැසිවරු සියල්ලන් දේව දර්ශනයකින් කැඳවීම ලැබීමයි.
iii. දිවැසිවරු සියල්ලන් ග්‍රන්ථ රචනා කර තිබීමයි.
iv. කැඳවීමලත් සැණින් එය භාරගෙන ක්‍රියා කිරීමයි.
v. එකම දෙවියන් වහන්සේගේ නියෝජිතයන් ලෙස දේව පණිවිඩය ප්‍රකාශ කිරීමයි.

16. දිවැස්වැකි කීමේ වරය ලත්, කන්‍යා දූවරුන් හතර දෙනෙකු සිටි, උපස්ථායක කණ්ඩායමේ සාමාජිකයකු හා ධර්මදූතයෙකු වන කයිසාරියෙහි දී ශු. පාවුලු තුමාට නවාතැන් දුන් තැනැත්තා වන්නේ,

i. අගබස් | ii. ස්කේවා | iii. යුතිකස්
iv. පිලිප් | v. අපොල්ලොස්

17. ඊශ්‍රායෙල්හි ප්‍රඥාව යනුවෙන් අර්ථ දක්වනුයේ,

i. ගෝත්‍රය තුළ එකමුතුකම රැක ගැනීමේ ක්‍රියාදාමය.
ii. රාජ්‍යය පාලනය කිරීමේ සාර්ථක බව.
iii. ඥානය පෙරදැරිකරගත් ව්‍යායාමය.
iv. නීති රීති අනුව ජීවත් වීමේ හැකියාව.
v. දෙවියන් හඳුනාගෙන සියල්ලට වඩා උන්වහන්සේට ආදරය කිරීම.

18. පිලිප්පි 2,5 - 11 හි ශු. පාවුලු තුමා 'සමාන' ස්වරූපය යන වචනය සඳහා භාවිතා කර ඇත්තේ, 'ඊසා' යන ග්‍රීක වචනයයි. එයින් අරුත් ගන්වනුයේ,

i. 'ඕනෑම පරිසරයක වෙනස් නොවන' යන්නයි. | ii. 'වහලෙකුගේ ස්වරූපය' යන්නයි.
iii. 'පුරවැසි අයිතිවාසිකම් නැත' යන්නයි. | iv. 'සියල්ල අතහැර හිස්වූ' යන්නයි.
v. 'පෙනුමෙන් දෙවියන් හා සමාන' යන්නයි.

19. නෝවා හා ජල ගැල්ම පිළිබඳ කතාවෙහි ලොව විනාශ කිරීමෙන් අදහස් කරනුයේ,

i. ලෝකයෙන් මිනිසා ඉවත් කර දැමීමයි.
ii. දෙවියන් වහන්සේගේ බලපරාක්‍රමය පෙන්වීමයි.
iii. මිනිසා වර්ධනය කළ අයහපත තුරුන් කර දැමීමයි.
iv. පළමු මැවිල්ල විනාශයට පත් කිරීමයි.
v. මැවිල්ලේ අංග වල ක්‍රියාකාරීත්වය පෙන්වා දීමයි.

20. මනුෂ්‍යයා ලැබූ මුල්ම ගැලවීමේ සුපුවත උත් 3:15 හි අඩංගු පාඨය ' ප්‍රාථමික සුවිශේෂය ලෙසින් හඳුන්වනු ලැබූ සභා පියවරයා වන්නේ,

i. ශු. අගුස්තීනුතුමා | ii. ශු. අයිරේනියස් තුමා | iii. ශු. ජෙරොම් තුමා
iv. ශු. අම්බ්‍රෝස් තුමා | v. ශු. බැසිල් තුමා

21. ශු. බයිබලයේ ප්‍රධාන කතෘ දෙවියන් වහන්සේ හා උප කතෘ මිනිසා බව සඳහන් වන විශ්ව ලේඛනය වන්නේ,

i. දෙවියන් වහන්සේ ප්‍රේමයය.
ii. දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ
iii. සුපුවතේ ආනන්දය
iv. දිව්‍ය සංරක්ෂණය
v. වර්තමාන ලෝකයේ ශු.සභාව

22. මිසරයේ රජුගේ දියණියක සරණ පාවාගෙන මිසරයේ රජු සමඟ ගිවිසුමක් ඇති කරගත් ක්‍රි.පූ. 961 - 922 අතර රාජ්‍ය පාලනය කළ රජු වන්නේ,

i. ජෙරබෝවම් රජ
ii. දාවිත් රජ
iii. සාවුල් රජ
iv. නෙබුකද්නසාර් රජ
v. සලමොන් රජ

23. මිනිසාව දෙවියන් වහන්සේ ඒදන් උයනින් පිටතදී මැවීම හා පසුව එහි පිහිටු වීම තුලින් පෙන්වනුයේ,

i. මිනිසා කෙරෙහි දෙවියන් වහන්සේගේ අවිශ්වාස සහගත බවයි.
ii. මිනිසා නැමති මැවිල්ල නොවටිනා බවයි.
iii. ලැබිය යුතු ප්‍රමාණයකට වඩා ඔහුට දී ඇති බවයි.
iv. ඒදන් උයන මිනිසුන්ට නුසුදුසු පරිසරයක් බවයි.
v. දෙවියන් වහන්සේ මිනිසාව පරීක්ෂා කොට බලන බවයි.

24. පාපය නිසා දෙවියන් වහන්සේ ශෝක වන බව ජලගැල්ම පිළිබඳ කතාවෙහි බයිබල් කතුවරයා දක්වා ඇත්තේ,

i. දෙවියන් වහන්සේට ද ශෝකය ඇතිවන බව පෙන්වීමට.
ii. පාපයේ බරපතලකම පෙන්වීමට.
iii. ශෝකය මිනිස් දිවියට උරුම බව පෙන්වීමට.
iv. නෝවා පව් නොකළ බව තහවුරු කිරීමට.
v. දෙවියන් වහන්සේව මානව රූපාකරයෙන් දැක්වීමට.

25. ඊශ්‍රායෙල් ජනතාව සීනයි ගිවිසුම සඳහා සූදානම් වූ ආකාර පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

i. පවිත්‍ර වීම, චර්මඡේදනය, බැටළුවකු මරා මස් අනුභවය
ii. කැප කිරිම, කන්ද ස්පර්ශ නොකිරීම, රුධිරය ඉසීම.
iii. පවිත්‍ර වීම, කන්දෙන් බැහැරව සිටීම, ස්ත්‍රී සේවනයෙන් තොරවීම.
iv. ස්නානය, තිත්ත පලා අනුභවය, පූජකයා ඉදිරියෙහි පෙනී සිටීම.
v. බැටළුවකු මරා උගේ මස් අනුභවය, රුධිරය පූජාසනයේ තැවරීම, හිස අත් පා සේදීම.

26. ක්‍රිස්තුන් වහන්සේ දේව මාලිගාවේ කොත මුදුනින් පහළට පැනීම ප්‍රතික්ෂේප කිරීම මගින් පෙන්වා දෙන්නේ,

i. උන්වහන්සේ සිය අධිකාරි බලය අයුතු ලෙස ප්‍රයෝජනයට නොගන්නා බව.
ii. උන්වහන්සේට කීර්තිමත් වීමේ අවශ්‍යතාවක් නැති බව.
iii. ධනයට කළ හැකි කිසිවක් නැති බව.
iv. සිය බලය අන් අයට ප්‍රදර්ශනය කළ යුතු නැති බව.
v. දෙවියන් වහන්සේව ප්‍රතික්ෂේප නොකළ යුතු බව.

27. 'ශරීරය' යන්න අරුත් ගැන්වීමට 'සෝමා' (Soma) යන ග්‍රීක පදය භාවිතා කරන්නේ කුමන පොතද?

i. ශුද්ධ වූ මතෙව් ii. ශුද්ධ වූ මාක් iii. ශුද්ධ වූ ලූක්
iv. ශුද්ධ වූ ජොහාන් v. I කොරින්ති

28. ශුද්ධ වූ ජොහාන් සුබාරංචියට අනුව ජේසුස් වහන්සේ හා නිකදේමුස් අතර ඇති වූ දෙබසට අනුව බෞතීස්ම ස්නාපනය හඳුන්වා දිය හැක්කේ,

i. පව් කමාවෙන් ලබන නව උපතක් ලෙස
ii. ස්වර්ග රාජ්‍යය උරුම කර ගැනීමට ලැබෙන රුකුලක් ලෙස
iii. උත්ථානයේ පෙර ලකුණක් ලෙස
iv. දෙවිඳුන් හා මිනිසා අතර සබඳතාව ගොඩ නගන්නක් ලෙස
v. ආත්මයාණන්ගෙන් ලබන නව උපතක් ලෙස

29. සමාරියේ දහම් සේවයේ යෙදෙන අතරතුර මායාකාර සීමොන්ව බෞතීස්ම ස්නාපනය කළේ,

i. ජොහාන් අපෝස්තුළුතුමා ii. උපස්ථායක පිලිප්තුමා
iii. තද්දේවුස් අපෝස්තුළුතුමා iv. උපස්ථායක ස්තේපන්තුමා v. ශුද්ධ වූ පාවුලුතුමා

30. කිතුනු පූජකවරුන්ට හා රදගුරුවරුන්ට හිරිහැර පීඩා කිරීම ආරම්භ වූයේ,

i. ට්‍රාජන් අධිරාජ්‍ය සමයේ ii. නීරෝ අධිරාජ්‍ය සමයේ
iii. මාකස් අවුරේලියස් අධිරාජ්‍ය සමයේ iv. මැක්සිමිනස් අධිරාජ්‍ය සමයේ
v. වැලේරියන් අධිරාජ්‍ය සමයේ

31. පහත සඳහන් වගන්ති අතරින් ශුද්ධ වූ ජස්ටින්තුමාට පමණක් අදාළ වන වගන්තිය වන්නේ,

i. තර්කවේදීන් අතර දක්ෂතම තර්කවේදියා
ii. හෙබ්‍රෙව් ශුද්ධ ලියවිල්ල ලතින් භාෂාවට පරිවර්තනය කරන ලද සභාපියවරයා
iii. එපීස මන්ත්‍රණ සභාවේ ශ්‍රේෂ්ඨ ධර්මාචාර්යවරයා
iv. කාර්තේජ් නගරයේ රෝම ශතාධිපතියෙකුගේ පුතෙකි.
v. වේදභේද විවේචනය නමැති කෘතියේ රචකයා

32. 'තලෙයියා' (Thaleia) යනුවෙන් හඳුන්වන්නේ,

i. ගීතාවලියේ ගීත වර්ගීකරණයෙන් එකකි.
ii. ශුද්ධ වූ ඔරිජන්තුමාගේ කෘතියකි.
iii. ඒරියස්ගේ දේශනාවල ගීතමය ලේඛනයකි.
iv. ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ ලියවිල්ලකි.
v. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් නිකුත් කළ විශ්ව ලේඛනයකි.

33. මිනිසාගේ මනුෂ්‍ය ස්වභාවය ජන්ම පාපය මගින් විනාශ වී ඇතැයි යන දුර්මතය හඳුන්වන්නේ,

i. පෙලාජියානුවාදය ලෙස ii. ඒරියන්වේදභේදය ලෙස
iii. අප්‍රධානතාවදය ලෙස iv. නෙස්ටෝරියන් වේදභේදය ලෙස
v. එව්ටිකියන් වේදභේදය ලෙස

34. ස්ලැවික් ග්‍රෝත්‍රික ජනතාවට නව අක්ෂර මාලාවක් හඳුන්වා දීමට කටයුතු කළේ,

i. ශුද්ධ වූ අම්බෝස්තුමා ii. මෙතෝඩියස් තාපසතුමා iii. සිරිල් තාපසතුමා

iv. ශාන්ත බෙනඩික්තුමා v. ශුද්ධ වූ අතනාසියුස්තුමා (පි.38)

35. පෙරදිග හා අපරදිග සභාභේදය සිදු වූ අවධියේ ඕර්තඩොක්ස් සභාවේ දෘශ්‍යමාන නායකයා වූයේ,

i. රෝමයේ පාප්තුමා ii. කොන්ස්තන්තිනෝපලේ අදිපිතෘතුමා

iii. රෝමයේ අධිරාජ්‍යවරයා iv. කොන්ස්තන්තිනෝපලයේ කාර්දිනල්වරයා

v. වතිකානුයේ අගරදගුරුතුමා (පි.40)

36. කතෝලික සභාවට සුවිශේෂී මෙහෙවරක් කළ තෝමස් ඇක්වයිනාස් දේවධර්මාචාර්යවරයා බිහි වූයේ,

i. ෆ්‍රැන්සිස්කාන නිකායෙනි. ii. අගුස්තීන නිකායෙනි.

iii. ඩොමිනිකාන නිකායෙනි. iv. ජේසු නිකායෙනි.

v. නිමල මරිය නිකායෙනි. (පි.42)

37. පහත සඳහන් ප්‍රකාශ පිළිබඳව සැලකිලිමත් වන්න.

a ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද ප්‍රසාද නිධාන දෙකකි.

b සක්‍රමේන්තු සතක් ඇත.

c ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම පූජකවරය ලැබිය හැකිය.

d දේවගැතිවරුන්ට විවාහ වීමේ අයිතියක් ඇත.

e සියලු සභා ඉගැන්වීම් ශුද්ධ ලියවිල්ල මත පමණක් පදනම් විය යුතුය.

මේවා අතරින් මාටින් ලූතර්ගේ ප්‍රධාන ඉගැන්වීම වන්නේ,

i. a, b හා c ය. ii. a, c හා d ය.

iii. b, c හා d ය. iv. c, d හා e ය.

v. c, d හා a ය. (පි.43)

38. දේශපාලන හා පෞද්ගලික අවශ්‍යතාවයක් පදනම් කර ගැනිමින් ක්‍රි.ව. 1534 දී අටවන හෙන්රි රජතුමා විසින් පිහිටුවන ලැබූ සභාව හඳුන්වන්නේ,

i. එවැන්ජලිකන් සභාව යනුවෙනි. ii. රෙපරමාදු සභාව යනුවෙනි.

iii. එංගලන්ත සභාව යනුවෙනි. iv. ප්‍රෙස්බෙටේරියන් සභාව යනුවෙනි.

v. ප්‍රොස්තෙස්තන්ත සභාව යනුවෙනි.

39. පූජක පුහුණුව සඳහා පදවි මට්ටමෙන් දෙව්සන්හල් ඉදිකිරිමේ ව්‍යාපෘතිය ආරම්භ වූයේ,

i. නිසියානු මන්ත්‍රණ සභාවෙන් ii. කොන්ස්තන්තිනෝපල් මන්ත්‍රණ සභාවෙන්

iii. එපීස මන්ත්‍රණ සභාවෙන් iv. කැල්සිඩොන් මන්ත්‍රණ සභාවෙන්

v. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවෙන්

40. හේබ්‍රෙව් බස කථා කරන ජුදෙව්වන් හා ග්‍රීක බස කතා කරන ජුදෙව්වන් අතර ගැටුම නිරාකරණ වුයේ,

i. ජෙරුසෙලම් මන්ත්‍රණ සභාවේ තීරණවලින් පසුව

ii. ජාකොබ්තුමා අන්තියෝකයේ රදගුරුතුමා වීමෙන් අනතුරුව ය.

iii. සහනාධාර බෙදා දීම අපෝස්තුළුවරුන් විසින් බාරගනු ලැබීමෙන් පසුව

iv. පේදුරුගේ ප්‍රථම දේශනාවෙන් අනතුරුව

v. උපස්ථායකයින් පත් කර ගැනීමෙන් පසුව

41. 'ක්‍රිස්තුන් වහන්සේ පියාණන් වහන්සේගෙන් ජනිත වූ නමුත් මවනු නොලැබ එකම භවත්වය ඇතිව වැඩ සිටීම' යන දේව ධාර්මික සංකල්පය ශුද්ධ වු සභාවට ඉදිරිපත් කරන ලද්දේ,

i. ශුද්ධ වු අතනාසියුස් තුමා
ii. ශුද්ධ වු ජෙරොම්තුමා
iii. ශුද්ධ වු අම්බ්‍රෝස්තුමා
iv. ශුද්ධ වු ටර්ටුලියන් තුමා
v. ශුද්ධ වු සිරිල්තුමා

42. ජෝන් කැල්වින්ට අනුව සභා පාලනය සඳහා වඩාත් සුදුසු වන්නේ,

i. පූජකවරුන් ය.
ii. පැවදිවරුන් ය.
iii. ගිහියන් ය.
iv. වැඩිහිටියන් ය.
v. රදගුරුවරුන් ය.

43. ප්‍රංශ විප්ලවය සමයේ දී (1789 - 1795) පැවැත් වූ යහගුණ මංගල්‍යය වැනි උත්සව මගින් බාධා ඇති වුයේ,

i. පාස්කු මංගල්‍යයට
ii. නත්තල් මංගල්‍යයට
iii. ඉරුදින දිව්‍ය පූජාවට
iv. කුඩාරම් මංගල්‍යයට
v. දේවස්ථාන වාර්ෂික මංගල්‍යට

44. අති උතුම් 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමන් විසින් රචිත 'රේරුම් නොවාරුම්' (Rerum Novarum) නැමැති විශ්ව ලේඛනයෙන් දෙන සමාජ පණිවිඩය වන්නේ,

i. පවුල් දිවියේ සාර්ථකත්වය පිළිබඳව
ii. දිව්‍ය භෝජනය නිසි ලෙස වැළදීම පිළිබඳව
iii. ඒකදේව වන්දනාව පිළිබඳව
iv. සමාජ සාධාරණත්වය පිළිබඳව
v. දසයෙන් කොටස දීමේ නීතිය පිළිබඳව

45. දිළින්දන් හා ධනවතුන් අතර පවතින පංතිභේදය තුරන් විය යුතු බව අන්තර්ගත වී ඇති විශ්ව ලේඛනය වන්නේ,

i. මව සහ ගුරුවරිය
ii. ලෝක සාමය
iii. වෙහෙසෙන මිනිස්සු
iv. අතීන්ද්‍රීය ක්‍රිස්තු දේහය
v. ක්‍රිස්තුන් වහන්සේ තුළ ශු.සභාව

46. කිසිදු බාධාවකින් තොරව, ශුද්ධ වු සභාව ප්‍රංශය තුළ ව්‍යාප්ත වීමට මුල් වු සිදුවීම වුයේ,

i. අටවන හෙන්රි අධිරාජ්‍යයා ශුද්ධ වු සභාවෙන් ඉවත්වී යාම

ii. 1554 දී ත්‍රිදෙන්තීනු සභාව කැඳවීම

iii. රෙපරමාදු විප්ලවය ඇතිවීම

iv. මාටින් ලූතර් සිය ඉගැන්වීම් ප්‍රචාරය කිරීම

v. ඉංග්‍රීසි හා ප්‍රංශ හමුදා සමග පැවැති යුද්ධයෙන් නැපෝලියන් පරාජය වීම

47. පළමු වන වතිකාන මන්ත්‍රණ සභාවේ දී ගත් තීරණවලට අනුව, ශුද්ධෝත්තම පියතුමාගේ අධිකාරිය පිලිබඳව ගන්නා ලද ස්ථාවරයන් ද්විත්වය වන්නේ,

i. ගිහි නායකයන් පත් කිරීම හා සක්‍රමේන්තු දානය ii. ශීලධාර්මික පැවැත්ම හා බඹසර රැකීම

iii. අධිරාජ්‍යය පාලනයේ අයිතිය හා ආගමික අධිකාරිය iv. නොවරදින සුළුභාවය හා නායකත්වය

v. දේව ධර්මය විග්‍රහ කිරීම හා කිතුනු අනුගාමිකයන් බිහි කිරීම

48. පෘතුගීසීන් විසින් ශ්‍රී ලංකාව තුළ දහම් ප්‍රචාරය කිරීම ප්‍රධාන කාර්යයක් කර ගත්තේ,

i. යටත් විජිතවල සහා ආරක්ෂකභාරය නිසා

ii. තෝමස් අපෝස්තුළුතුමාගේ මග පෙන්වීම නිසා

iii. ඉන්දියාවට ආසන්නයේ ම පිහිටි රට නිසා

iv. නව මුහුදු මාර්ග සොයා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස

v. පූජකවරුන් බිහි කිරීමේ අවශ්‍යතාව නිසා

49. ධජ ආචාරය සමග දිව්රුම් දීමක් සිදු කරමින් බැතිමතුන් බඳවා ගන්නා සභාව වන්නේ,

i. ප්‍රෙස්බෙටේරියන් සභාව

ii. ගැලවීමේ හමුදාව

iii. මොතෝදිස්ත සභාව

iv. යෙහෝවාගේ සාක්ෂිකාරයන්

v. ඇන්ග්ලිකන් සභාව

50. දේව සබඳතාව අත්දැකීමට නම් බැහැපත්කම අවශ්‍ය බව තම ජීවිතයෙන් සාක්ෂි දරමින් පෙන්වා දුන්නේ,

i. අසීසියේ ප්‍රැන්සිස්තුමා ii. ශුද්ධ වු සෙබස්තියන් මුනිතුමා

iii. ජේසුගේ කුඩා මල වන තෙරේසා තුමිය iv. ශාන්ත ඇග්නස් තුමිය

v. ශුද්ධ වු තාර්සීසියස්තුමා